(© Nekath.lk - Download By http://www.nekath.lk)

# දරුණු වසංගතයක් පැතිරෙන බව 2019 වර්ෂයේ අප කියූ අනාවැකිය.....

කාලය හා අවකාශය තුළ සොබාදහම අපූර්ව දේ සිදු කරයි.මේ බව කල්තියා හඳුනා ගැනීමට හැකි ක්‍රමවේදයක් මිහිපිට පවතී ද?මේ පැනයට පිළිතුරු සෙවීමේ දී දිලිසීමේ විද්‍යාව හෙවත් ජෝතිර්වේදය සොබාදහමේ කාලමානය ලෙස හඳුනා ගැනීමට පුළුවන. සොබාදහම තේරුම් ගැනීමට ගත් උත්සහයක ප්‍රතිඵල වශයෙන් ලෝකයට නොයෙකුත් ආගම්,දර්ශන හා න්‍යායන් බිහිවිය.ජ්‍යොතිෂ්‍යවේදය ද එසේ ගොඩනැගුණු ප්‍රබල න්‍යායකි.

**සොබාදහමේ විද්‍යාව ජෝතිර්වේදය** යන්න අපගේ නිර්වචනයයි.ලෝකයේ ඕනෑ ම රටක්,පුද්ගලයෙක් සම්බන්ධයෙන් කල්තියා අනාවැකි හෝ පුරෝකථන ගෙන ඒමට මේ විෂයට ඇත්තේ සුවිශේෂී හැකියාවකි.අඳුරේ දිගු ගමනක් යන ලෝකයාට ජෝතිර්වේදය පහන් සිළුවක් වෙයි.ඒ ඒ සැතපුම් කණුව අසල දී ඔහු මුහුණ දෙන අටලෝදහමේ ස්භාවය මේ විෂය තුළින් කල්තියා ම කියාපායි.සැබවින් ම මේ විෂය විද්‍යාත්මක පදනමක් මත ගොඩනගා,ඈත අතීතයේ සිට ම පැවත එයි. වර්තමානය වන විට මේ විෂයෙන් වැඩගන්නෝ දෙපිරිසක් වෙති.එක් පිරිසක් මේ විෂය දඩමීමා කර ගනිමින්,මිත්‍යාව පතුරවමින් ලෝකය මුළා කොට ආර්ථික වාසි ලබති. තවත් අයෙක් බොහෝ උත්සහයෙන් ගවේෂණ,පර්යේෂණ කාර්යයේ යෙදෙමින් මෙහි ඇති සත්‍යය සොයති.පළමුව කී පිරිස සුලබ නිසා මේ විෂය වර්තමානය වන විට ලෝකය තුළ මිත්‍යාවක් බවට පත්වෙමින් පවතී.මෙවන් පසුබිමක් තුළ අප ආයතනය බොහෝ කලෙක සිට ජෝතිර්වේදය ආදී ගුප්ත විෂයන් අධ්‍යයනය කරමින් ඒ සඳහා විද්‍යාත්මක න්‍යායක් ගොඩනැගීමට වෙහෙසෙයි. ඉදිරි වර්ෂයන් පිළිබඳ පුරෝකථන ගෙන ඒම එහි එක් අංශයකි. **2019 වර්ෂය** සම්බන්ධයෙන් අප කියූ අනාවැකිය මේ ලිපිය සඳහා පාදක වේ.

**2019 සිට 2020 සිංහල- හින්දු අලුත් අවුරුදු උදාව දක්වා කාල පරාසය** තුළ විශේෂ වශයෙන් ශ්‍රී ලංකාවේ හා අවශේෂ වශයෙන් ලෝකයේ ඇතිවිය හැකි තත්වයන් 2019 වර්ෂයආරම්භයේ දීම පැහැදිලි කෙරුවෙමු.(www.nekath.lk වෙබ් අඩවියට පිවිසෙන්න. එහි විශේෂාංග ලිපි→ අනාවැකි ලිපි )

දරුණු **කොරෝනා වෛරසය** ලෝකය ම ගිලගනිමින් පවතින මොහොතක අප පෙර කී අනාවැකිය එලෙස ම සත්‍යයක් වූ බව පවසන්නේ,සංවේගය පිරි හදවතිනි. එම ලිපියෙන් මේ වසංගතය පිළිබඳව අප පෙන්වා දුන් කරුණු අතර ,

- **පරමාණුක සහ රසායනික ක්‍රියා මඟින් විනාශකාරී තත්වයන් නිර්මාණය වීම**
- **ඇදහිය නොහැකි පුදුම සහගත දේ තුළින් ක්ෂණික මරණ බහුල වීම**
- **විවිධ රෝග සහ ව්‍යසන උද්ගත වීම**
- **මහජන කායික-මානසික සෞඛ්‍ය පිරිහීම සහ ව්‍යාකූල සමාජ පසුබිමක් නිර්මාණය වීම**
- **අධ්‍යාපනය කෙරෙහි අසුබ තත්වයක් උදාවීම**

යන උධෘත විශේෂ වෙයි.ජෝතිර්වේදය පෙන්නුම් කරන ආකාරයට මෙම වෛරසය මිනිස් ක්‍රියාකාරකමක ප්‍රතිඵලයකි.මේ අයුරින් ම **2019 වර්ෂයේ ඇති වූ බෝම්බ පිපිරීමේ** සිද්ධියද අප විසින් කල්තියා පුරෝකථනය කොට ඇත.හේතුඵල දහමට අනුව ලෝකය තුළ සිදුවන අහිතකර දෑ වෙනස් කිරීමට නම්, මේ විෂයන් ගුරුකොට ගැනීමට දැන් කාලය එළඹ ඇත. මන්ද යත්,සොබාදහමට අවනත නොවන සියල්ල විනාශ වන බැව් මේ විද්‍යාව තුළින් අපට පසක් කරන බැවිනි**.**

*-උපුල් දොඹේපොල-*

**www.nekath.lk**

**වැඩි විස්තර සඳහා අමතන්න 071 94 9797 5 / 076 53 9797 5 / 045 4 550 648**

(© Nekath.lk - Download By http://www.nekath.lk)